# ලාක්ෂා කර්මාන්තය

ලාක්ෂා කර්මාන්තය යනු වසර 400 පමණ පැරණි කර්මාන්තයකි.අතීතයේ මෙම කර්මාන්තය ආසියාවේ මෙන්ම යුරෝපයේද පැතිර පැවතිනි.නමුත් අද වන විට මෙම කර්මාන්තය ලංකාව, ඇෆ්ගනිස්තානය, පකිස්ථානය, ඉන්දියාව, මාලදිවයින සහ චීනය වැනි රටවල් අතලොස්සක පමණක් දක්නට ලැබේ. ලංකාවේ මෙම කර්මාන්තය අදවන විට මාතලේ සහ දකුණු පළාතේ ඇතැම් ප්‍රදේශයන්ට සීමා වී ඇත.ලාක්ෂා යනු සංස්කෘත වදනකි.සැබවින්ම ලාක්ෂා කර්මාන්තය යනු නමින් ලාකඩ කර්මාන්තයයි.මෙම කර්මාන්තය නියපොතු වැඩ  පට්ටල් වැඩ  ලෙස ප්‍රධාන වශයෙන් කොටස් 2 කට බෙදේ.

මෙහි නියපොතු වැඩ යනු ලංකාවට අනන්‍ය ක්‍රමයකි.අනෙක් ක්‍රමය සෙසු රට වලද දක්නට ලැබේ.නියපොතුවැඩ ක්‍රමය මහින්දාගමනයෙන් පසු ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වන අවස්ථාවේ පැමිණි අටලොස්කුල ශිල්පීන්ට සම්බන්ධය.

ප්‍රධාන වශයෙන් මෙම ලාක්ෂා සාදා ගැනීමට ලාක්ෂා කෘමී විශේෂයන් (Lac Insects) උපකාරී වේ.එම සත්වයාගේ ශරීරයෙන් පිටවන ලාටු සුළඟ වැදී ඝනීභවනයට ලක්වීමෙන් ලාක්ෂා නිර්මාණය වේ.

ලාකඩ, කෝන්, මසං, කැප්පෙටියා ගස්වල එම කෘමීන් විසින් සාදන ලද කූඩුවල කුඩු සූරා ගෙනවිත් රත් කොට ලාකඩ පෙරාගෙන එම ලාක්ෂා දියකර වර්ණ සමඟ මුසුකර තලා පදම් කර ගැනීමෙන් ලාක්ෂා කැබලි නිර්මාණය කරයි.

රතු කුඩු - සාදලිංගම් නැමති රතුගල් කුඩු කරගෙන ඇත.  ඇත් දළ පාට, කහ නිල් පාට වර්ග සඳහා ද පොළවේ ඛනිජ වර්ග යොදාගෙන වර්ණ සකස් කර තිබේ.

ප්‍රධාන වශයෙන් ගිනිසපු සහ ගන්සූරිය වැනි ශාක කොටස් ලාක්ෂා ආලේප කිරීම සඳහා භාවිත කෙරේ. ඒවා කපා පොතුගසා ලියවන පට්ටලයක  ආධාරයෙන් අවශ්‍ය හැඩය මතුකර ගැනීමෙන් පසු අත් යන්ත්‍රයකට දමා කරකැවීමෙන් වර්ණාලේපනය සිදුකරනු ලබයි.

අතීතයේ ලංකාව තුලදීම මේ ලක්ෂා ඉටි ලබා ගත්තද පරිසර විනාශය වැනි සාධක නිසාවෙන් මෙම කෘමීන් පරිසර පද්දතියෙන් ඉවත් වී ඇත.දැන් මෙම ඉටි ආනයනය  කරනු ලබන්නේ ඉන්දියාවේ ලාහෝර් ප්‍රදෙශයෙන් වන අතර අතිතයේ භාවිත කල වර්ණ වෙනුවට ඒ සමගම ආනයනය  කරන කෘතීම ඩයි වර්ග භාවිත කරයි.

 ඒ අනුව උනුකරගත් ලක්ෂා ඉටි වලට වර්ණක යොදා අවශ්‍ය ප්‍රමාණයට කොටස් වලට වෙන්කර ගිනි සපු හා ගං සූරිය ලි වර්ග ලාක්ෂා කර්මාන්තය සඳහා යොදා ගන්නා අතර එය පළමුවෙන් කපා පොතු ගසා ලියවන පට්ටලය ආධාරයෙන් අවශ්‍ය හැඩය මතුකර ගැනීමෙන් පසු අත් යන්ත්‍රයට සවිකර කැර කැවීමෙන් ලාක්ෂා ආලේප කර ගනු ලබනවා. ඉන්පසු පන් කොලයකට පොල්තෙල් ආලේප කර පිරි මැදීමකින් භාණ්ඩයේ ඔපවත් බව වැඩි කර අවසානයේ කටුවක් ආධාරයෙන් ශ්‍රී ලංකාවට අවේණික කැටයම් ඒ මත නිර්මාණය කරයි.

ලාක්ෂා කර්මාන්තය ආශ්‍රයෙන් විවිධ නිර්මාණ සිදුකරන අතර නිවසට අවශ්‍ය කරන හැම උපකරණයක්ම, භාණ්ඩයක්ම ලාක්ෂා කර්මාන්තය ආශ්‍රයෙන් නිර්මාණය කිරීමට හැක. ආභරණ පෙට්ටි, හැඳි වර්ග, අළු බඳුන්, බුලත් තට්ටු, වළලු, මල් බඳුන්, යතුරු රඳවන, බීරළු නොයෙක් විසිතුරු උපාංග මේ අතර කැපී පෙනේ.

#ලාක්ෂා #අත්කම් #පාරම්පරික #හස්තකර්මාන්ත